# ප්‍රවෘත්ති නිවේදනය
# Press Release

## පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

"සොබාදම්පියස", අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල. දුරකථන ඃ 0112034100(4349)

2024.10.22

අධ්‍යක්ෂ ප්‍රවෘත්ති

ප්‍රවෘත්ති කර්තෘ

**පාරිභෝගිකයින්ට සහනදායි මිලට පොල් ලබා දීමේ අරමුණින් පොල් වගා කිරිමේ මණ්ඩලයෙන් ජංගම අලෙවි රථ වැඩසටහනක්**

පවතින පොල් මිල හමුවේ පාරිභෝගික ජනතාව මුහුණ දි තිබෙන දුෂ්කරතාවයට විසඳුමක් ලෙස ජංගම අලෙවි රථ වැඩසටහනක් පරිසර,වනජිවි,වන සම්පත්,ජල සම්පාදන,වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සම්බන්ධිකරණයෙන් ආරම්භ කිරීමට කටයුතු යොදා තිබේ.

**(2024.10.23) වන දින එහි පළමු අදියර කොළඹ,ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ,කඩුවෙල නගර සභා බල සීමා ප්‍රදේශයන් මුල්කර ගනිමින් ක්‍රියාත්මකයි.**

**කොළඹ බල ප්‍රදේශයේ වැලිකඩ පොලීසිය අසලත්,කිරුළපන පොදු වෙළඳපොළ සහ මුදල් අමාත්‍යාංශ පරිශ්‍රය ආසන්නවත් ජංගම ලොරි රථ මගින් බෙදාහැරීම් සිදු වේ.ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ නගර සභා සීමාවට අයත් වැලිකඩ පොලීසිය ආසන්නව සහ නුගේගොඩ ආනන්ද සමරකොන් එලිමහන් රංග පීඨය අසල ද පොල් බෙදා හැරිමේ ජංගම වැඩසටහන ක්‍රියාත්මක වේ.**

**කඩුවෙල සහ බත්තරමුල්ල බල ප්‍රදේශයන් ආවරණය කරමින් සෙත්සිරිපාය රජයේ කාර්යාල පරිශ්‍රය ආසන්නව සහ ඩෙන්සිල් කොබ්බෑකඩුව පොල් වගාකිරිමේ මණ්ඩලය පිහිටි ස්ථානය ආසන්නව පාරිභෝගිකයින්ට පොල් මිලදි ගැනීමට පහසුකම් සපයා තිබේ.**

**ප්‍රධාන නගරයන් හි දි ජනතාවට සහන ක්‍රමයකට පොල් මිලදි ගැනීමට ඒ අනුව අවස්ථාව ලැබෙනු ඇත.පසුව සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක වීමට නියමිතයි.**

**පොල් වගා කිරිමේ මණ්ඩලය විසින් දිනකට පොල් ගෙඩි දසදහසක් (10,000) වෙළපොලට එක් කරන අතර සඳුදා,බදාදා සහ සිකුරාදා දිනයන්වල පසුව ක්‍රමිකව දිනකට පොල් ගෙඩි පන්දහ (5000) බැගින් සතියකට පොල් ගෙඩි 15,000 ක් පාරිභෝගික ඉල්ලුම අනුව වෙළඳපොලට යොමු කරනු ඇත.**

**මීට අමතර කුරුණෑගල වැවිලි සමාගම මැදිහත්ව (2024/10/22 ) දින පොල් ගෙඩි 1500 බැගින් දිනපතා සැපයිමට කටයුතු සුදානම් කර ඇති අතර 2024/10/23 සිට හලාවත වැවිලි සමාගම දිනකට ගෙඩි 3000 බැගිනුත් දිනපතා ලබාදීමට එකඟ විය.** මෙහිදි පොල් ගෙඩියක් රු 100 – 120 ක මිලකට පාරිභෝගිකයින්ට ලබාදීමට අපේක්ෂිතය.

**-මාධ්‍ය ඒකකය**